# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2321/61 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය යටතේ**
**බලතල පැවරීමේ නියෝගය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 02 (2) වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහය වීම පිණිස පත් කර ඇත්තා වූ පහත උපලේඛනයේ ඇතුළත් එහි I වැනි තීරුවේ නම සඳහන් අනුරූපීයව II තීරුවේ සඳහන් තනතුරු දරන්නන් වෙත එහි උපලේඛනයෙහි III තීරුව යටතේ නිශ්චිතව විස්තර වන බලතල 2023.01.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී, ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර්ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2023 ක් වූ පෙබරවාරි මස 17 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.


1A - PG 6242 — 07 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### I වැනි උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| 1) අත්තනායක ආරච්චිගේ පුෂ්පා | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමූපකාර ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ අංක 02 (3), 4, (4(2) හැර), 5, 6, 7, 8, 33, 43 (අ), 43 (ආ), 44, 45, 46, 47, 50, 52,53,54, (54(2) හැර), 58 (2),59, 67, 68, 69, 74 හා 76 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල සහ 1972 අංක 05 දරන සමූපකාර රීති මාලාවේ 4, 11, 15, 16 (III), 19, 22, (II), 27, 32, 37, 39,40, 41, 42, 49, 52 හා 53 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල |
| 2) චන්ද්‍රානි මංගලිකා හපුආරච්චි | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | |
| 3) ගීතාංගනී ජයතුංග | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | |
| 4) නයිද හේවා රුවන් අමරදේව | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | |

EOG 03 - 00011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.